සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

25A S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**

විභාග අංකය ............................ ඉන්දියා ඉතිහාසය I කාලය පැය එකයි

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

- **අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා නාම 5 බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නාම සමඟ නොගැලපේ. එම නොගැලපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය තිත් ඉරමත ලියන්න.**

01. 1. අංග 2. මගධ 3. කාසි
4. ශාක්‍ය 5. කෝසල (.....)

02. 1. භාරත වර්ෂ 2. ජම්බුද්වීපය 3. ආර්යවර්ථ
4. දඹදිව 5. ඉන්දෝස් (.....)

03. 1. හින්දුකුෂ් 2. වින්ධ්‍යා 3. ආරවල්ලි
4. ඔරිස්සා 5. සුලෙයිමාන් (.....)

04. 1. ඛයිබර් 2. බෝලාන් 3. කිර්නාර්
4. මක්‍රාන් 5. බැරෝඩා (.....)

05. 1. මේඝදූතය 2. අර්ථ ශාස්ත්‍රය 3. ඍතු සංහාරය
4. කුමාර සම්භවය 5. ශාකුන්තලය (.....)

06. 1. ජෝන් මාර්ෂල් 2. මෝටිමර් විලර් 3. ස්ටුවට් පිගොට්
4. කමලා නඩේසන් 5. අර්නස්ට් මැකේ (.....)

07. 1. නාලන්දා 2. තක්ෂිලා 3. වලභි
4. වික්‍රමශිලා 5. ජගද්දිලා (.....)

08. 1. භාරුකච්ච 2. සුප්පාරක 3. ලෝතාල්
4. කල්‍යාණි 5. තාම්‍රලිප්ත (.....)

09. 1. පූර්ණ කස්සප 2. නිගණ්ඨනාථ පුත්‍ර 3. ගෞතම බුද්ධ
4. මක්ඛලි ගෝසාල 5. අජිත කේශකම්බල (.....)

10. 1. නර්මදා 2. ගෝධාවරී 3. කාවේරි
4. තුංගභද්‍රා 5. මහානදී (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැලපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11. 1. වින්ද්‍යා - බැරෝඩා
2. හින්දුකුෂ් - ඛයිබර්
3. සුලෙයිමාන් - මක්‍රාන්
4. නිල්ගිරි - පාල්ගාට්
5. ආරවල්ලි - දිල්ලි (.....)

12. 1. මෙගස්තීන්ස්ගේ - ඉන්ඩිකා
2. ප්‍රකෝපියස් - පර්සියානු යුද්ධ
3. කල්හාණගේ - රාජතරගංණය
4. ඉට්සිං - සද්ධර්ම වාර්තා
5. හියුංසාං - ශ්‍රමණ වෘතාන්තය (.....)

13. 1. අංග - චම්පා
2. කාසි - බාරානාසි
3. සූරසේන - කුසිනාරා
4. කෝසල - ශ්‍රවස්ති
5. අවන්ති - උජ්ජයිනි (.....)

14. 1. ඉන්ද්‍ර - කුණාටුවට අධිපති දෙවි
2. වරුණ - අහසට අධිපති දෙවි
3. යම - මළවුන්ට අධිපති දෙවි
4. ප්‍රජාපති - සියලු සත්වයන්ගේ අධිපති
5. කුවේර - ධනයට අධිපති දෙවි (.....)

15. 1. මගධ - බිම්බිසාර
2. වත්ස - උදයන
3. අවන්ති - චණ්ඩපජ්ජෝත
4. කෝසල - ප්‍රසේනජිත්
5. කුරු - බ්‍රහ්මදත්ත (.....)

- **අංක 16 - 20 තෙක් වූ ප්‍රශ්නය සඳහා x හා y තීරුවල නාම/ප්‍රකාශන/දින වකවානු දී ඇත. y තීරුඅවේ දී ඇති නාම/ප්‍රකාශන දින වකවානු x තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිලිවෙලට නොවේ. x තීරුව y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට පහත දී ඇති සංකේත පහෙන් එකක් නිවැරදිය. එම නිවරදි අංකය තෝරා වරහන තුළ යොදන්න.**

16.

| | X | Y |
|---|---|---|
| 1. | රෝම | A පර්සියානු යුද්ධ |
| 2. | අරාබි | B ඉන්ඩිකා |
| 3. | ග්‍රීක | C මහා භාරතය |
| 4. | ඉන්දියානු | D ශ්‍රමණ වෘතාන්තය |
| 5. | චීන | E සිල් සිලාන් අල් තවාරිං |

1. ABECD 2. ADECB 3. ACEBD
4. AEBCD 5. ACBED (.....)

17.

| | X | Y |
|---|---|---|
| 1. | කුල | A පවුල |
| 2. | සෝම | B පැරණි ඉන්දියානු කාසි වර්ගයක් |
| 3. | පුර් | C ශුද්ධ වූ පානයක් |
| 4. | නිෂ්ක | D පාලන ඒකකයක් |
| 5. | රාෂ්ට්‍ර | E බලකොටු නගරයක් |

1. ABECD 2. ACEBD 3. ACDBE
4. AEDBC 5. ADEBC (.....)

18. X Y

1. යමුනා ගඟ — A මොහෙන්ජොදාරෝ
2. සින්දු ගඟ — B භාරුකච්ච
3. කාවේරි ගඟ — C දිල්ලිය
4. නර්මදා ගඟ — D තාම්‍රලිප්ත
5. ගංගා ගඟ — E තන්ජෝරය

1. CABED 2. CAEDB 3. CBAED
4. CADEB 5. CAEBD (.....)

19. X Y

1. වලභි — A අධ්‍යාපන
2. අජන්තා — B රථ
3. මථුරා — C ලෙන් විහාර
4. මහා බලිපුරම් — D බුද්ධ ප්‍රතිමා
5. තංජෝර් — E හින්දු දේවාල

1. ABDCE 2. AEDBC 3. ACDBE
4. ADEBC 5. ACEBD (.....)

20. X Y

1. ඍග් වේදය — A ගුප්ත යුගය
2. ධර්ම සූත්‍ර — B සුංග යුගය
3. සූත්‍ර පිටක — C පූර්ව වෛදික යුගය
4. මනුස්මෘති — D බෞද්ධ යුගය
5. සකුන්තලා — E පශ්චාත් වෛදික යුගය

1. CABDE 2. CBDEA 3. CEDAB
4. CEDBA 5. CDBAE (.....)

- **අංක 21 - 25 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති තිත් ඉරිමත ලියන්න.**

21. ඉන්දියාවේ ලියවී ඇති පැරණිතම කෘතිය ලෙස හඳුනාගෙන ඇත්තේ,
1. රාමායනය 2. මහාභාරතය 3. ඍග්වේදය
4. අර්ථ ශාස්ත්‍රය 5. දිව්‍යාවදානය (.....)

22. පර්සියානුවන් ඉන්දියාව හඳුන්වන ලද්දේ,
1. ඉන්ඩිකා 2. ඉන්දොස් 3. සින්දොස්
4. භාරතය 5. ජම්බුද්වීප (.....)

23. පැරණි ධාන්‍යාගාරය නටඹුන් හමුවන ඉන්දු නිම්න නගරය කුමක්ද?

1. රූපාර් 2. මොහෙන්ජොදාරෝ 3. ලෝතාල්
4. හරප්පා 5. කලිබංගන් (.....)

24. නන්ද රාජ වංශයේ අන්තිම පාලකයා කවුරුන්ද?

1. ධනනන්ද 2. උදායීන් 3. වාසුදේව
4. නන්දිවර්මන් 5. මහා පද්ම (.....)

25. බෞද්ධ සාහිත්‍යයට අනුව ගණ රාජ්‍ය නොවන ආණ්ඩු ක්‍රමයක් පැවතියේ කොහේද?

1. කෝලීය 2. ලිච්ඡවි 3. අවන්ති
4. විදේහ 5. මල්ල (.....)

- **අංක 26 - 30 දක්වා සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

26. ඍග් වෛදික ජනයාගේ සමාජ තත්වය

1. සමාජයේ පදනම වූයේ පීතෘ මූලික පවුලය.
2. ඒක පත්නි විවාහය පිළිගත් විවාහ ක්‍රමය විය.
3. සමාජය තවමත් ගෝත්‍රික අවදියේ විය.
4. පුර වටා සමාජය කේන්ද්‍රගතව තිබිණ.
5. මහජනතාවගේ මතය සභා සහ සමිති මගින් ප්‍රකාශ කෙරිණි. (.....)

27. ඉන්දු නිම්න වැසියන්ගේ ආගමික විශ්වාස,

1. මව්දෙවඟන වැදීම. 2. මිනිසුන් බිලිදීම.
3. ජලය ශුද්ධ වස්තුවක් ලෙස සැලකීම. 4. වෘක්ෂ වන්දනය
5. ශිව දෙවියන් පශුපති ලෙස වන්දනා කිරීම. (.....)

28. පැරණි ඉන්දියානු ඉතිහාසය හැදෑරීමේදී සෙල්ලිපිවලින් ලැබෙන වටිනාකම,

1. සෙල්ලිපි සැමවිටම නිවැරදි හා සත්‍ය තොරතුරු දක්වයි.
2. වැදගත් ස්ථාන පිළිබඳ තොරතුරු දැනගත හැකිවීම.
3. කාලය නිර්ණය කිරීමට උපකාරී වේ.
4. ලේඛන ක්‍රමවේද පිළිබඳ අදහසක් ලබාගත හැක.
5. රාජධානිවල බලය ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ දැනගැනීමට හැකිවීම. (.....)

29. මගධ රාජ්‍යයේ වර්ධනයට හේතු,

1. දක්ෂ පාලකයන් බිහිවීම. 2. භූගෝලීය පිහිටීම
3. අසල්වැසි රාජ්‍යවලින් ලද සහය. 4. උපරිම වශයෙන් සම්පත් තිබීම.
5. කෘෂිකර්මය දියුණු කිරීම. (.....)

30. ඉන්දු නිම්න සභ්‍යත්වය පරිහීමට හා බිඳ වැටීමට බලපෑ සාධක ලෙස ඉදිරිපත් වී ඇති මතවාද,

1. ජලගැනීම්
2. පාරිසරික වෙනස්කම්
3. වසංගත ලෙඩ රෝග
4. ප්‍රධාන නගර දෙක අතර බල අරගලය
5. ආර්ය ආක්‍රමණ (.....)

- **ප්‍රශ්න අංක 31 - 35 දක්වා එක් ක් ප්‍රශ්නයට දක්වා ඇති A,B, C, D යන ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කීපයක් හෝ නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,**

  **A හා B පමණක් නිවැරදි නම් අංක 1 ද**

  **B හා C පමණක් නිවැරදිනම් අංක 2 ද**

  **C හා D පමණක් නිවැරදිනම් අංක 3 ද**

  **A හා C පමණක් නිවැරදිනම් අංක 4 ද**

  **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිනම් අංක 5 ද වරහන තුළ ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | Aහා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැදිය. |

31. ඍග් වෛදික යුගය

A) ඒක දේව වාදය දක්නට ලැබීම

B) කාන්තාවන්ට යාඥා සඳහා සහභාගිවීමට අවසරයක් නොවීම.

C) මෙම අවධියේ ප්‍රධාන දෙවිවරුන් දෙදෙනෙක- වූයේ වරුණ හා ඉන්ද්‍රය.

D) යාගය සංකීර්ණය. (.....)

32. ඉන්දියාවේ භූගෝලීය ලක්ෂණ

A) උතුරින් හිමාලය කඳුවැටියෙන් සීමා වි ඇත.

B) උතුරු ඉන්දියාව සත්පුර කඳුවැටියෙන් සීමා වේ.

C) වින්ද්‍යා කඳුවැටියෙන් ඉන්දියාව කොටස් දෙකකට බෙදේ.

D) වයඹ දිග ඉන්දියාව තුළින් බාහිර ලෝකය හා සම්බන්ධ වී ඇත. (.....)

33. ඉන්දියාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර

A) මානව ධර්ම ශාස්ත්‍ර කෘති ඉතිහාසය හැදෑරීමට අදාළ නොවේ.

B) භාරතීයයන් ඉතිහාසය ලිවීමට දැරූ උත්සාහයක් ලෙස හරිවංශය ලියා ඇත.

C) ඉන්දියානුවන් ඉතිහාසය ලියා තැබීමට උනන්දුවක් දක්වා නැති බව අල්බීරූණී ප්‍රකාශ කර ඇත.

D) ඉන්දියාවේ අතීත වීරයන්ගේ වීර ක්‍රියා මහා භාරතය හා රාමායනය කෘතිවලින් හෙළි වේ. (.....)

34. හින්දුස්ථාන් තැනිතලාව

A) ගංගා යමුනා තැනිතලාව අධිරාජ්‍යවලට ජන්මභූමිය විය.

B) ගංගා හා අතුගංගා පෝෂණය වූ සශ්‍රීකත්වය ආර්ථිකය ශක්තිමත් කිරීමට හේතු විය.

C) නැගෙනහිර සාට්ස් හා බටහිර සාට්ස් නමින් කඳුවැටි පිහිටා ඇත.

D) ගංගා නම් ගඟේ අතු ගංගා වලින් පෝෂණය වේ. (.....)

35. ඉන්දියානු අධිරාජ්‍ය

A) විවිධ භූ ලක්ෂණ පිහිටීම නිසා එක්සේසත්කමට බාධාවක් විය.

B) ජාති, කුල, ආගම්, ගෝත්‍රවලින් ගහන රටක් විය.

C) රටක් ලෙස පාලනය කිරීමට පහසුවක් ඇති විය.

D) මුළු ඉන්දියාවම යටත්කර ගැනීමට කිසිවෙකුට නොහැකි වීම. (.....)

- **පහත දැක්වෙන අංක 36-40 තෙක් වූ ප්‍රශ්නවලට ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4 සහ 5 යන කවර විග්‍රහය දැයි තෝරා තිත් ඉරමත ලියන්න.**

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 1. නිවැරදිය | නිවැරදිය |
| 2. නිවැරදිය | වැරදිය |
| 3. වැරදිය | වැරදිය |
| 4. වැරදිය | නිවැරදිය |
| 5. නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. පශ්චාත් වෛදික යුගය ස්වභාවික වස්තු වන්දනයට මුල් තැන දීම. | පශ්චාත් වෛදික යුගය බහුදේවවාදය හා ඒකදේවවාදය කරා ගමන් කිරීම. (.....) |
| 37. ඉන්දියාවේ වැඩිම සෙල්ලිපි ගණනක් නිකුත්කොට ඇත්තේ අශෝක රජුය. | ඛරෝෂ්ඨී, ඇරමයික්, ප්‍රාකෘත, අර්ධ මාගධී සංස්කෘතික භාෂාවන්ගෙන් මෙම සෙල්ලිපි කොටවා ඇත. (.....) |
| 38. ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ පැවති සමූහාණ්ඩු හැඳින්වීමට සංඝ හා සංඝ යන නම් භාවිත කෙරිණි. | සියලුම සමූහාණ්ඩු පිහිටා තිබුණේ සශ්‍රීක ගංගා නම් ගංගා මිටියාවතේය. (.....) |
| 39. ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ කලාව මැටි, හුණුගල් හා ලෝකඩවලින් කලාකෘති නිර්මාණය කොට ඇති බව පෙනේ. | මෙම ශිෂ්ටාචාරයට අයත් ප්‍රදේශ වලින් අග්නි දේවරූප බහුලව ලැබී තිබේ. (.....) |
| 40. මහා ඇලෙක්සැන්ඩර් සෙලියුකස් නිකේටර් පහසුවෙන් ඉන්දියාව ආක්‍රමණය කරන ලදී. | විදේශ ආක්‍රමණිකයින්ට වයඹදිග ඉන්දියාවට ඇතුළු වීමේදී ථාර් කාන්තාරය ඉමහත් බාධකක් විය. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

25A | S | II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**

විභාග අංකය ............................  **ඉන්දියා ඉතිහාසය II**  කාලය පැය දෙකයි

උපදෙස්

♦ පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

| | |
|---|---|
| (i) පුරුෂ පුරය | (v) මගධය |
| (ii) මොහෙන්ජොදාරෝ | (vi) වින්ධ්‍යා කඳු |
| (iii) භාරු කච්ඡ | (vii) මථුරා |
| (iv) කාවේරි ගඟ | (viii) ඛයිබර් දූර්ගය |

නිවැරදිව ලකුණු කොට නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි. (ල. 18)

02. පැරණි ඉන්දීය ඉතිහාසය හැඩගැස්වීමට භූගෝලීය සාධක බලපෑ ආකාරය පහත සඳහන් මාතෘකා යටතේ විමසීමට ලක් කරන්න.
(i) හින්දුස්ථානී තැනිතලාව (ii) අර්ධද්වීපික ඉන්දියාව (ල. 14)

03. ඉන්දියාවේ බිහිවූ ඉතා සාර්ථක ශිෂ්ටාචාරයක් වූ ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පිරිහීමට හා බිඳ වැටීමට බලපෑ හේතු සාකච්ඡා කරන්න. (ල. 14)

04. ඉන්දීය ඉතිහාසය හැදෑරීමට උපකාරීවන සාහිත්‍ය මූලාශ්‍රවල වැදගත්කම පරික්ෂා කරන්න. (ල. 14)

05. ඉන්දීය ඉතිහාසය මූලාශ්‍රයන් වන නටඹුන් හා කාසිවල ස්වභාවය උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ල. 14)


06. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආගමික විශ්වාස හා මතිමතාන්තර පිළිබඳ ඇගයීමක් කරන්න. (ල. 14)

07. (i) ආර්යයන් ඉන්දියාවට පිවිසි දූර්ග මාර්ගය නම් කරන්න. (ල. 1)
(ii) ආර්යයන් ඉන්දියාවට පැමිණ පදිංචි වූ ප්‍රදේශය නම් කරන්න. (ල. 1)
(iii) ඍග් වෛදික යුගයේ සමාජ තත්වය පිළිබඳ කෙටි විමසීමක් කරන්න. (ල. 6)
(iv) පශ්චාත් වෛදික යුගයේ ආර්ථික තත්වය පිළිබඳ කෙටියෙන් ලියන්න. (ල. 6)

08. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් දෙකක් තෝරාගෙන ඓතිහාසික සටහන් ලියන්න.
(i) සොළොස් මහා ජනපද
(ii) වයඹදිග කපොලු
(iii) සංගම් සාහිත්‍යය
(iv) ගංගා යමුනා තැනිතලාව (එක් කොටසකට ලකුණු 7 බැගිනි)

## 12 / 13 **ඉන්දියා ඉතිහාසය** - 12 / 13 இந்திய வரலாறு

| විභාග අංකය<br>சுட்டெண் | |
|---|---|




N

**දෙවන වාර පරීක්ෂණය - ඉන්දියා ඉතිහාසය.**
**පිළිතුරු 12 - ශ්‍රේණිය 1 කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 4 | 11. | 3 | 21. | 3 | 31. | 2 |
| 2. | 3 | 12. | 4 | 22. | 2 | 32. | 5 |
| 3. | 4 | 13. | 3 | 23. | 4 | 33. | 3 |
| 4. | 3 | 14. | 1 | 24. | 1 | 34. | 1 |
| 5. | 2 | 15. | 5 | 25. | 5 | 35. | 4 |
| 6. | 4 | 16. | 4 | 26. | 4 | 36. | 1 |
| 7. | 3 | 17. | 2 | 27. | 2 | 37. | 5 |
| 8. | 4 | 18. | 5 | 28. | 1 | 38. | 2 |
| 9. | 3 | 19. | 3 | 29. | 3 | 39. | 3 |
| 10. | 1 | 20. | 4 | 30. | 4 | 40. | 4 |

(ලකුණු 40)

**11 පත්‍රය - පිළිතුරු**




01. කරුණු දක්වා ඇත ආකාරයට සුදුසු පරිදි පිළිතුරු ලබා දෙන්න.

02. (i) **හින්දුස්ථානී තැනිතලාව:**

* ආර්යයන් පැමිණීමෙන් පසුව ජනාවාස ව්‍යාප්තියේදී ප්‍රබල වැදගත් කමක් ඇති ප්‍රදේශයකි. සරු පස, තැනිතලා බිම් සහ ජලය යන පහසුව නිසා මෙහි පහසුවෙන් ජනාවාස ව්‍යාප්ත වෙනු දක්නට ලැබේ.
* පසුකාලීනව ඉන්දියාවේ ප්‍රබල අධිරාජ්‍යයන්වූ මෞර්ය, ගුප්ත වැනි අධිරාජ්‍යයන් මෙහි බිහිවී තිබේ.
* ගංගා යමුනා තැනිතලාව නිසා මෙම ප්‍රදේශය ආර්ථික වශයෙන් ද වැදගත් ය.
* උතුරින් හිමාලය, දකුණින් නර්මදා හා තප්ති නදීන් හා වින්ධ්‍යා කඳුවැටිය, ථාර් කාන්තාරය ආදී භූගෝලීය පිහිටීම් මෙම හින්දුස්ථාන් තැනිතලාවට ආරක්ෂාව සැපයීය.

(ii) **<u>අර්ධද්වීපික ඉන්දියාව :</u>**
*

03. මේ සඳහා හේතු ගණනාවක් බලපා ඇති බව විවිධ ඉතිහාසඥයින්ගේ මතයයි.
1. ජල ගැලීම් නිසා විනාශ වීම. මෝටිමර් වීලර් , ජෝන් මාර්ෂල්, ඒ.වී. ශර්මා වැනි ඉතිහාසඥයින් මෙම මතය තහවුරු කොට තිබේ.
2. රාවී ගඟේ ගමන් මාර්ගය වෙනස් වීම. මේ නිසා නිවාස පිහිටියාවූ ප්‍රදේශවල රොන්මඩ තැන්පත්වීම ආදිය හේතුවෙන් මෙහි නිවාසවල දොර ජනෙල් තාවකාලිකව ගඩොල් යොදා වසා ඇති බව දක්නට ලැබීම.
3. ක්‍රමික ආර්ථික පරිහානිය, නාගරීකරණය, පාලනය දුර්වල වීම, වසංගත රෝග.
4. දේශගුණික වෙනස්වීම් - මෙම ශිෂ්ටාචාරය නිර්මාණයට බහුලව ගඩොල් යොදාගෙන තිබේ. ගඩොල් පිලිස්සීමට අධික ලෙස දර අවශ්‍ය නිසා කැළෑ එළි කිරීම හේතුවෙන් දැඩි නියං තත්වයන් ඇතිවීම.
5. සතුරු ආක්‍රමණයන් හෝ ගිනි තැබීමකින් විනාශවූ බව.

04. සාහිත්‍ය මූලාශ්‍ර වර්ග 2කි. දේශීය සාහිත්‍ය මූලාශ්‍ර හා විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර.
**<u>දේශීය :</u>** ආගමික ග්‍රන්ථ, ලෞකික, වෙනත් සාහිත්‍ය කෘති, හින්දු, වෛදික, බ්‍රාහ්මණ කෘති, උපනිෂද් ග්‍රන්ථ, භගවත් ගීතාව, බෞද්ධ ග්‍රන්ථ - ත්‍රිපිටකය. ජාතක කතා, ජෛන සූත්‍ර
**<u>විදේශීය :</u>** ග්‍රීක, රෝම මූලාශ්‍ර, චීන, ටිබෙට් වාර්තා අරාබි වාර්තා, ලංකාවේ වංශකතා, මේවා විස්තර කොට ඒවායේ ඇතුළත් ඉන්දීය ඉතිහාස තොරතුරු ඉස්මතු කර දක්වන්න.

05. ඉන්දියා ඉතිහාසය හැදෑරීමට ඉවහල්වන පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර වර්ග - නටඹුන්, සෙල්ලිපි, කාසි, ගොඩනැගිලි හා ස්මාරක, පුරාවිද්‍යාත්මක භෂ්මාවශේෂ, චිත්‍ර, මූර්ති, ස්ථූප ආදිය දක්නට ලැබේ. මේවා අතර නාලන්දා විශ්ව විද්‍යාලයේ නටඹුන්, දේශනශාලා, නේවාසිකාගාර, දාන ශාලා ආදිය විශේෂිතය. එමෙන්ම ලෙන් විහාර, චෛත්‍ය. බුද්ධ ප්‍රතිමා චිත්‍ර කලාප ආදී දෙය විස්තර කරන්න.
කාසිවර්ග අතර - ග්‍රීක, බ්‍රැක්ටියන්, සිතියන්, පාර්තියන්, ගුප්ත , කුෂාණ ආදී රජවරුන්ට අයත් කාසි හමුවීම. මේවා තුළ රජවරුන්ගේ නිල ලාංඡන, විරුද නාමයන් දක්නට ලැබීම තුළින් ඉතිහාස ගත තොරතුරු හෙළිවේ.

06. ඉන්දු නිම්නයේ ආගමික විශ්වාස.
මව් දෙවඟන පිදීම., ලිංග වන්දනය, වෘක්ෂ වන්දනය, ජල වන්දනය, සත්ව වන්දනය, සශ්‍රීකත්වය මුල් කරගත් බිලි පූජා, ත්‍රිමූර්තිය, පශුපති වන්දනය, මහායෝගී රුව වන්දනය, මේ එක් එක් කරුණු විස්තර කොට ලිවිය යුතුය.

07. (i) ඛයිබර් දුර්ගය (ii) පංජාබ් ප්‍රදේශය (සප්ත සින්දු)
(iii) සමාජ - * පීතෘ මූලික සමාජය. * ගෝත්‍රික සමාජ ලක්ෂණ පැවතීම. * කාන්තාවන්ට සමාජයේ උසස් තැනක් හිමිවීම. * විවාහ සිරිත්, ඇඳුම් පැළඳුම්, කෑම බීම, නිවාස, විනෝදාංශ ආදිය විස්තර කරන්න.
(iv) ආර්ථික - * කෘෂිකර්මාන්තය, සත්ව පාලනය, වෙළඳාම, කර්මාන්ත ආදිය පිළිබඳ මෙන්ම විදේශීය දේශීය වෙළඳාම පිළිබඳ විස්තර ලිවීම සෑහේ.

08. (i) සොළොස් මහා ජනපද
ක්‍රි.පූ. 6 දී බිහිවූ ජනපද 16 කි. ඒවා ගෝත්‍රික තත්වයෙන් මිදී තිබුණි. මේවායේ රාජාණ්ඩු සහ සමූහාණ්ඩු පාලන ක්‍රම පැවතුනි.
රාජාණ්ඩු : මගධ, කෝසල, වත්ස්‍ය, අවන්ති
සමූහාණ්ඩු : ලිච්ඡවි, (ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකි.)

(ii) වයඹ දිග කපොලු - වයඹ දිග ඉන්දියාවේ කපොලු ඉන්දියාව අර්ධද්වීපයක් ලෙස බාහිර ලෝකයට විවෘත කරයි. වයඹ දිග ඉන්දියාවේ භූ ලක්ෂණ කඳු, දුර්ග මාර්ග, ගංගා, සශ්‍රීක බිම් ප්‍රදේශ ඉතිහාසයට විවිධ බලපෑම් කර තිබේ. වයඹින් පිහිටි හින්දුකුෂ් කඳුවැටිය, සුලෙයිමාන්, තිර්තාර් කඳුවැටි වඩා ආරක්ෂිත ස්වභාවික පිහිටීමය. මේවා අතරින් පිහිටි ඛයිබර්, බෝලාන්, මක්‍රාන් දුර්ග වරින් වර ඉන්දියාවට ආක්‍රමණ වලට මඟ පාදා තිබේ.

(iii) සංගම් සාහිත්‍යය : ක්‍රි.පූ. 1 - 3 සියවස්වල අවස්ථා 3කදී විවිධ ස්ථානවල සිදු කොට තිබේ. පළමු සංගමය කවීන් 4449 ක් සහභාගිත්වයෙන් කබාඩපුරම් හි දීද, තුන්වැන්න කවීන් 444 කගේ සහභාගිත්වයෙන් මුදුරාවේද සිදුකොට ඇත. දකුණු ඉන්දියාවේ ද්‍රවිඩ රාජධානිවල තොරතුරු මේ මඟින් හෙළිකර ගත හැක. මේවා කිව්‍ය 2279 කින් යුක්ත වේ. කවීන් 473 දෙනෙකු විසින් රචනා කොට ඇත.

(iv) ගංගා යමුනා තැනිතලාව - මෙම තැනිතලාව ඉන්දියාවේ සශ්‍රීකත්වය කෙරෙහි මහත් බලපෑමක් කොට තිබේ. හින්දුස්තාන් තැනිතලාව මෙන්ම ගංගා යමුනා තැනිතලාවද සමාජ, ආර්ථික, සංස්කෘතික අංශවශයෙන් ඉතා වැදගත් වේ.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

25 | S | I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

## Second Term Test - Grade 12 - 2018

විභාග අංකය .............................. **ලංකා ඉතිහාසය I** කාලය පැය එකයි

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියලු ප්‍රශ්න වලට **මෙම පත්‍රයේම** පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

- අංක **01** සිට **05** දක්වා ප්‍රශ්නවලට නම් **පහ** බැගින් දී ඇත. කුමන හෝ හේතුවක් මත එකක් අනෙක්වා සමඟ **නොගැළපේ** එම **නොගැළපෙන** පදයට හිමි අංකය අදාළ හිස්තැනෙහි ලියන්න.

1. 1. රොබට් නොක්ස් 2. ක්වේරොස් 3. මේජර් ඩේවි 4. එමර්සන් ටෙනන්ට් 5. ජෝන් ඩොයිලි (.....)

02. 1. සංගමු විහාර ලිපිය 2. පොළොන්නරු කතිකාවත 3. ගල්පොත ලිපිය 4. අඹගමුව ලිපිය 5. තෝනිගල ලිපිය (.....)

03. 1. හුංගම 2. බූන්දල 3. පතිරාජවෙල 4. විල්පත්තු 5. පල්ලෙමලල (.....)

04. 1. කපිසීස 2. උත්තිය 3. මිගාර 4. මූලව 5. සාලිය (.....)

05. 1. මින්නේරි වැව 2. නාච්චදූව 3. හුරුළුවැව 4. කිඹුල්වානාවැව 5. මහකණදරා වැව (.....)

- අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න වල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

06. 1. වසභ රජු - වල්ලිපුරම් සන්නස
2. උත්තිය රජු - මිහින්තලේ ලෙන් ලිපිය
3. පළමු විජයබා රජු - අඹගමු සෙල්ලිපිය
4. සද්ධාතිස්ස රජු - රජගල ලිපිය
5. හතරවන උදය රජතුමා - හෝපිටිගම ටැම් ලිපිය (.....)

07. 1. හුරුළු වැව - යාන් ඔය
2. නාච්චාදූව වැව - මල්වතු ඔය
3. යෝධ වැව - වනනදී
4. කලා වැව - කලා ඔය
5. පරාක්‍රම සමුද්‍රය - මහවැලි ගඟ (.....)

08. 1. මුටසීව රජු - මහමෙවුනා උයන ඉදිකිරීම
2. දේවානම්පියතිස්ස රජු - වෙල්ගම් විහාරය කරවීම
3. වලගම්බා රජු - අභයගිරි විහාරය කරවීම
4. මහසෙන් රජු - ජේතවන විහාරය කරවීම
5. නිශ්ශංක මල්ල රජු - උත්තරාරාමය කරවීම (.....)

09. 1. ඉරණමඩු තැම්පතුව - ප්ලයිස්ටොසීන යුගය
2. ක්‍ෂුද්‍ර ශිලා මෙවලම් - ප්‍රාග් ඓතිහාසික යුගය
3. යකඩ මෙවලම් භාවිතය - පූර්ව ඓතිහාසික යුගය
4. වාපී ගම්මාන - මුල් ඓතිහාසික යුගය
5. නගර බිහිවීම - පූර්ව රාජ සමය (.....)

10. 1. සද්ධර්මරත්නාවලිය - ධර්මසේන හිමි
2. නිකාය සංග්‍රහය - දේවරක්ඛිත ජයබාහු ධම්මකිත්ති හිමි
3. විශුද්ධිමග්ග - මහානාම හිමි
4. රසවාහිනිය - වේදේහ හිමි
5. සිංහල බෝධි වංශය - විල්ගම්මුල හිමි (.....)

- **අංක 11 - 15 තෙක් වූ ප්‍රශ්නය සඳහා x හා y තීරුවල නාම/ප්‍රකාශන/දින වකවානු සමුහයක් දී ඇත. y තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන දින වකවානු x තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. x තීරුව y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට පහත දී ඇති සංකේත පහෙන් එකක් නිවැරදිය. එම නිවැරදි අංකය තෝරා වරහන තුළ යොදන්න.**

11.

| | x | | y |
|---|---|---|---|
| 1. | දන්තකුමරු හා හේමමාලා කුමරිය දළදා වහන්සේ වැඩම කිරීම | A | සූකරකිත්ථ |
| 2. | ජය ශ්‍රී මහා බෝධිය වැඩම කිරීම | B | දඹකොළපටුන |
| 3. | භද්දකච්චායන කුමරිය ලංකාවට ගොඩබැසීම | C | ලංකාපටුන |
| 4. | තීරු බදු පිළිබඳ අභිලේඛණයක් හමුවීම | D | ගොඩවාය |
| 5. | ඌරාතොට නමින් හැඳින්වීම | E | ගෝකණ්ණ |

1. CBEDA 2. BCEDA 3. BECDA
4. ABCED 5. BECAD (.....)

12.

| | x | | y |
|---|---|---|---|
| 1. | රජගල ලිපිය | A | විහාරාරාම පාලනය පිළිබඳ තොරතුරු |
| 2. | මිහින්තලේ පුවරු ලිපිය | B | වෙළඳපොළක පාලනය පිළිබඳ තොරතුරු |
| 3. | සැස්සේරුව ලිපිය | C | වෙළඳ ශ්‍රේණි පිළිබඳ තොරතුරු |
| 4. | බදුළු ටැම්ලිපිය | D | දසමහා යෝධයින් පිළිබඳ තොරතුරු |
| 5. | සංඛපාල විහාර ලිපිය | E | මහින්දාගමනය පිළිබඳ තොරතුරු |

1. EABCD 2. AECBD 3. EACBD
4. EACDB 5. ABECD (.....)

13. x y

| | x | | y |
|---|---|---|---|
| 1. | විජය රජතුමා | A | භද්දකච්චායනා කුමරිය |
| 2. | පණ්ඩුවාසදේව රජතුමා | B | පාලිකුමරිය |
| 3. | පණ්ඩුකාභය රජතුමා | C | කල්‍යාණවතී දේවිය |
| 4. | පළමුවන විජයබාහු රජතුමා | D | විජායි කුමරිය |
| 5. | නිශ්ශංකමල්ල රජතුමා | E | තිලෝකසුන්දරී දේවිය |

1. DACEB 2. ADEBC 3. DAECB
4. DACBE 5. DABCE (.....)

14. x y

| | x | | y |
|---|---|---|---|
| 1. | ගෝඨාභය රජතුමා | A | කාශ්‍යප රජතුමා |
| 2. | සද්ධාතිස්ස රජතුමා | B | කාවන්තිස්ස රජතුමා |
| 3. | මහසෙන් රජතුමා | C | වෝහාරිකතිස්ස රජතුමා |
| 4. | ධාතුසේන රජතුමා | D | ශ්‍රී මේඝවර්ණ රජතුමා |
| 5. | සිරිනාග රජතුමා | E | ලජ්ජතිස්ස රජතුමා |

1. BEDAC 2. EBDAC 3. BECAD
4. ABECD 5. CEDAB (.....)

15. x y

| | x | | y |
|---|---|---|---|
| 1. | නගර වුඩික | A | වෙළඳ කටයුතු භාර ප්‍රධානී |
| 2. | බතගු | B | නගරික වාස්තු විද්‍යාඥ |
| 3. | කොතුරුගැනා | C | රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී |
| 4. | කනපෙඩික | D | වත්සිරිත් පිළිබඳ අධිකාරී |
| 5. | පන අදෙක | E | භෝජනශාලාධිකාරී |

1. EBDAC 2. BEDCA 3. BEDAC
4. ABEAC 5. ABDEC (.....)

- **අංක 16 - 20 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.**

16. පහත සඳහන් සාහිත්‍ය මූලාශ්‍ර රචනා වූ කාලානුපිළිවෙළ ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.
   1. දීපවංසය, අමාවතුර, සමන්තපාසාදිකා, සිංහල බෝධිවංසය, බුදුගුණ අලංකාරය
   2. සමන්තපාසාදිකා, දීපවංසය, අමාවතුර, බුදුගුණ අලංකාරය, සිංහල බෝධිවංසය
   3. දීප වංසය, සමන්තපාසාදිකා, අමාවතුර, සිංහල බෝධි වංසය, බුදුගුණ අලංකාරය
   4. සමන්තපාසාදිකා, දීපවංසය, අමාවතුර, සිංහල බෝධි වංසය, බුදුගුණ අලංකාරය
   5. අමාවතුර, දීපවංසය, සමන්තපාසාදිකා, සිංහල බෝධි වංසය, බුදුගුණ අලංකාරය (.....)

17. පහත සඳහන් ඓතිහාසික සිදුවීම් කාලානුපිළිවෙළට ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.
   1. බුදුන්වහන්සේගේ ලංකාගමනය, මහින්දාගමනය, විජයාවතරණය, ෆාහියන් හිමිගේ ලංකාසංචාර, සංඝමිත්තා ගමනය.
   2. විජයාවතරණය, බුදුන්වහන්සේගේ ලංකාගමන, මහින්දාගමනය, සංඝමිත්තාගමනය, ෆාහියන් හිමියන්ගේ ලංකා සංචාරය
   3. බුදුන්වහන්සේගේ ලංකාගමනය. මහින්දාගමනය, සංඝමිත්තාගමනය, විජයාවරතණය, ෆාහියන් හිමියන්ගේ ලංකා සංචාරය
   4. විජයාවතරණය, බුදුන්වහන්සේගේ ලංකාගමන, සංඝමිත්තාගමනය, මහින්දාගමනය, ෆාහියන් හිමිගේ ලංකා සංචාර
   5. බුදුන්වහන්සේගේ ලංකාගමන, විජයාවතරණය, මහින්දාගමනය, සංඝමිත්තා ගමනය, ෆාහියන් හිමිගේ ලංකා සංචාරය (.....)

18. පහත සඳහන් දාගැබ් ඉදිකරන ලද කාලය අනුව ඒවායේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ කවර වරණයේද?
   1. ථූපාරාමය, මිරිසවැටිය, රුවන්වැලිසෑය, අභයගිරිය, ජේතවනය
   2. ථූපාරාමය, රුවන්වැලිසෑය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවනය
   3. මිරිසවැටිය, ථූපාරාමය, රුවන්වැලිසෑය, අභයගිරිය, ජේතවනය
   4. ථූපාරාමය, මිරිසවැටිය, රුවන්වැලිසෑය, ජේතවනය, අභයගිරිය
   5. ථූපාරාමය, රුවන්වැලිසෑය, මිරිසවැටිය, ජේතවනය, අභයගිරිය (.....)

19. අනුරාධපුරයේ මුල් යුගයේ රජවරුන් කලානු පිළිවෙළලට ගැලපූ විට නිවැරදි පිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.
   1. දේවානම්පියතිස්ස, මුටසීව, මහාසිව, උත්තිය, සූරතිස්ස
   2. දේවානම්පියතිස්ස, මුටසීව, උත්තිය, මහාසිව, සූරතිස්ස
   3. මුටසීව, දේවානම්පියතිස්ස, සූරතිස්ස, උත්තිය, මහාසිව
   4. මුටසීව, දේවානම්පියතිස්ස, උත්තිය, මහාසිව, සූරතිස්ස
   5. මුටසීව, දේවානම්පියතිස්ස, මහාසිව, උත්තිය, සූරතිස්ස (.....)

20. කාලානුපිළිවෙළ අනුව ලංකාව පාලනය කළ පාලකයින්ගේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ කවර වරණයේද?
   1. පළමු විජයබාහු, ජයබාහු, වික්‍රමබාහු, දෙවන ගජබාහු, පළමුන පරාක්‍රමබාහු
   2. පළමුවන පරාක්‍රමබාහු, පළමුවන විජයබාහු, ජයබාහු, වික්‍රමබාහු, දෙවන ගජබාහු
   3. පළමුවන විජයබාහු, වික්‍රමබාහු, ජයබාහු, දෙවන ගජබාහු, පළමුවන පරාක්‍රමබාහු
   4. වික්‍රමබාහු, ජයබාහු, පළමුවන විජයබාහු, දෙවනගජබාහු, පළමුවන පරාක්‍රමබාහු
   5. පළමුවන පරාක්‍රමබාහු, වික්‍රමබාහු, දෙවන ගජබාහු, ජයබාහු, පළමුවන විජයබාහු (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. මධ්‍යම කඳුකරය
   1. ගිරිදුර්ග, ජලදුර්ග, වන දුර්ග ආදී ස්වාභාවික රැකවරණයන්ගෙන් යුක්තවීම.
   2. මධ්‍යම කඳුකරය නිසා මුළු රටෙහිම දේශපාලන ඒකාබද්ධතාවයක් ගොඩනැගීම අපහසුවීම.
   3. මධ්‍යම කඳුකරය මුල්කරගනිමින් සීතාවක රාජධානිය බිහිවීම.
   4. භූගෝලීය බෙදීම්වලට පාදක ස්ථානයක් වීම.
   5. ශ්‍රී ලංකාවේ නිදහස් අරගලවල මූලස්ථානයක් වීම. (.....)

22. අටුවා ග්‍රන්ථ
   1. අටුවා යනු ත්‍රිපිටක ග්‍රන්ථවල කරුණු විස්තර කිරීමට ලියන ලද ග්‍රන්ථ සමූහයකි.
   2. අට්ටකථා පළමුවෙන්ම සිංහල භාෂාවෙන් රචනාකර තිබුණි.
   3. පස්වන සියවසේදී බුද්ධඝෝෂ හිමියන් සිංහල අටුවා ග්‍රන්ථ පාලියට පරිවර්තනය කරන ලදී.
   4. මහා වංශයට ලියන ලද අටුවා ග්‍රන්ථය සම්මෝහවිනෝදනිය ලෙස හැඳින්වේ.
   5. ධම්මපාල තෙරුන්, උපසේන තෙරුන් ආදී හිමිවරුන් ප්‍රසිද්ධ අටුවාචාරීන් වහන්සේලා වෙති. (.....)

23. මධ්‍ය ශිලා යුගයේ ජනාවාස
   1. මේ වන විට මෙම යුගය පිළිබඳව පැරණිතම සාධක හමුව ඇත්තේ කුරුවිට බටදොඹ ලෙනෙනි.
   2. අදින් වසර 40000 කට පමණ පෙර ආරම්භ වූ බව විශ්වාස කෙරේ.
   3. දිවයිනේ සෑම පරිසර කලාපයකම පාහේ ජනාවාස ව්‍යාප්තව තිබී ඇත.
   4. මෙම යුගයේ මානවයා පොදුවේ බලංගෙඩ මානවයා ලෙස හැඳින්වේ.
   5. මෙම යුගයේදී ස්වාභාවික ගල්ලෙන් හා විවෘත එළිමහන් ස්ථාන බහුල ලෙස ජනාවාස ලෙස තෝරාගෙන ඇත. (.....)

24. සීගිරිය
1. කාශ්‍යප රජතුමාගේ නිර්මාණයකි.
2. කුවේරයාගේ ආලකමන්දාව සේ ගොඩනගා ඇත.
3. ජල මල් උද්‍යානය ශ්‍රී ලංකික ජල තාක්ෂණයේ මහිම ලෝකයට කියාපාන කැඩපතක් බඳුය.
4. සීගිරි සිතුවම් මගින් කාශ්‍යප රජුගේ අන්තඃපුර බිසෝවරුන් නිරූපිත බව ආචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතයයි.
5. සීගිරි කැටපත් පවුර ලංකා ඉතිහාසයේ වැදගත් අභිලේඛනයකි. (.....)

25. පළමුවන විජයබහු රජතුමා
1. රාජ්‍යත්වයට පත්වීමට පෙර කීර්ති කුමාරයා නමින් හඳුන්වා ඇත.
2. පොළොන්නරුව ලංකාවේ දෙවන අගනගරය බවට පත්කරගන්නා ලදී.
3. කාලිංග මාඝගේ ග්‍රහණයෙන් රජරට මුදවාගන්නා ලදී.
4. බුරුම දේශයෙන් උපසම්පදාව ලබා ලක්දිව උපසම්පදාව නැවත පිහිටවන ලදී.
5. විජයබාහු රජුගේ ළමා කාලය පිළිබඳ තොරතුරු පණකඩුව තඹ සන්නසෙන් අනාවරණය වේ. (.....)

- **ප්‍රශ්න අංක 26 - 30 දක්වා එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A, B, C, D යන ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කීපයක් හෝ නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,**

A හා B නිවැරදි නම් අංක **1** ද　　B හා C පමණක් නිවැරදි නම් අංක **2** ද
C හා D පමණක් නිවැරදි නම් අංක **3** ද　　A හා C පමණක් නිවැරදි නම් අංක **4** ද

ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි ගණනක් නිවැරදි නම් අංක 5 ද වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | Aහා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් නිවැදිය. |

26. රජරට වාරි තාක්ෂණය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
A) පූර්ව රාජ සමයේදී මෙරට ගම් වැව් ඉදිකර ඇත.
B) මහා පරිමාණ වැව් ඉදිකිරීමේ පුරෝගාමියා මහසෙන් රජුය.
C) වැව් බැම්මේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා රළපනාව ඉදිකර ඇත.
D) සොරොව්වෙන් ජලය පිටකිරීම පාලනය කිරීම සඳහා කලිගු බැම්ම ඉදිකර ඇත. (.....)

27. පූර්ව ඓතිහාසික යුගය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
A) සංචාරී දිවිපෙවත
B) ශිලා මෙවලම් භාවිතය ක්‍රමයෙන් අභාවයට යාම
C) පිළිස්සූ මැටි වළං භාවිතය
D) ඇට සැකිලිවල ගුරුගල් ආලේපය අවමංගල අභිචාර කටයුත්තක් සේ පැවතීම. (.....)

28. පොළොන්නරු රාජධානිය සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
A) අනුරාධපුර යුගයේදී කඳවුරු නුවර ලෙස හඳුන්වා ඇත.
B) චෝළයින් විසින් මෙය තම අගනගරය බවට පත්කරගන ජනනාථ මංගලම් ලෙස හඳුන්වා ඇත.
C) ගෝකණ්ණ වරාය ආසන්නයේ පිහිටා ඇත.
D) දෙවන පැරකුම් රජතුමා මෙහි සිටි වැදගත්ම පාලකයා ලෙස සැලකේ. (.....)

29. පණ්ඩුකාභය රාජ්‍ය සමය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?

A) මාමා වරුන් පරදා ආර්ය ජනපදිකයින් අතර නායකත්වයට පත්වීම

B) ග්‍රාම සීමා ලකුණු කරවීම

C) සේන ගුත්තිකගේ ආක්‍රමණ මැඩ පැවැත්වීම

D) රෝහණය එක්සත් කිරීම. (.....)

30. ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?

A) අනුරාධපුර යුගයේදී රාජ්‍යත්වය අනිවාර්යයෙන් පියාගෙන් පුතාට උරුම විය.

B) අනුරාධපුර යුගයේදී රාජ්‍යත්වයට පත් කාන්තාවන් පරුමකලු නමින් හඳුන්වා ඇත.

C) දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේදී මෙරටට මෞර්ය අභිෂේකය හඳුන්වාදෙන ලදී.

D) නරඉසෙර යන විරුදය මෙරට රජවරුන් විසින් භාවිත කෙරිණි. (.....)

- **අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. ආර්ය ජනාවාසයක් වු උරුවේල ග්‍රාමය පිහිටා ඇති ගංගා නිම්නය වන්නේ,

1. මල්වතු ඔය 2. ගල් ඔය 3. දැදුරු ඔය

4. කාලා ඔය 5. මහවැලි ගඟ (.....)

32. පත්තිනි දේව ඇදහිල්ල ලංකාවට හඳුන්වාදෙනු ලැබූවේ කවර රාජ්‍ය කාලයකදී ද?

1. දේවානම්පිය තිස්ස අවධියේදීය 2. දුටුගැමුණු රාජ්‍ය කාලයේදීය.

3. වළගම්බා රාජ්‍ය සමයේදීය 4. කාශ්‍යප රජතුමාගේ අවධියේදීය.

5. පළමු ගජබාහු රජතුමාගේ අවධියේ දීය. (.....)

33. මහා වංසයේ දෙවන වෙළුම, පළමුවන කොටස රචනා කරන්නට ඇතැයි විශ්වාස කරනු ලබන්නේ කවුරුන් විසින්ද?

1. මහානාම හිමි 2. ධර්මකීර්ති හිමි

3. යගිරල පඤ්ඤානන්ද හිමි 4. තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිත හිමි

5. බෙල්ලන ඥානවිමල හිමි (.....)

34. සකපෝරුව භාවිතයෙන් සකස්කර වර්ණ ගන්වන ලද මැටි බඳුනක කොටස් හමු වූ පූර්ව ඓතිහාසික යුගයට අයත් ජනාවාසය කුමක්ද?

1. බෙරගල 2. උඩරංචාමඩම 3. ඉබ්බන්කටුව

4. යාපහුව 5. කළඹටුවාව (.....)

35. අනුරාධපුර යුගයේදී රාජ්‍යත්වයට පත් කාන්තාව කවුරුන්ද?

1. චූල සීවලී බිසව 2. ලීලාවතී බිසව 3. කළ්‍යාණවතී බිසව

4. සුගලා දේවිය 5. රත්නාවලී දේවි (.....)

අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ **දෙක** බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4, සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ **අංකය තිත් ඉර මත** ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| **පළමු වැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|
| 36. දේවානම් පියතිස්ස රජතුමා විසින් මිහිඳු හිමියන්ගේ උපදෙස් පරිදි මහා විහාරය ඉදිකරවන ලදී. | සංඝමිත්‍ර භික්ෂූන්ගේ උපදෙස් ගරු කළ මහාසේන රජතුමා මහා විහාරය සම්පූර්ණයෙන්ම විනාශකර දමන ලදී. (.....) |
| 37. සූරතිස්ස රජු දවස එළාර විසින් අනුරාධපුර රාජ්‍ය පැහැරගන්නා ලදී. | එළාර රජු වසර 44 කාලයක් අනුරාධපුර රාජ්‍ය දැහැමිව පාලනය කරන ලදී. (.....) |
| 38. වළගම්බා රාජ්‍ය සමයේදී රුහුණේ නකුල නගරයේ විසූ තීය නම් බ්‍රාහ්මණයෙක් රජුට විරුද්ධව කැරළි ගසන ලදී. | වළගම්බා රජතුමා තීය බමුණාගේ කැරැල්ල මර්දනය කරමින් සිටියදී සත්ද්‍රවිඩ ආක්‍රමණයක් එල්ල විය. (.....) |
| 39. සම්බුද්ධ පරිනිර්වාණය සිදු වූ දිනයේදී විජය කුමරු ඇතුළු සත්සියයක් පිරිස ලංකාවට ගොඩබසින ලදී. | උපතිස්ස ග්‍රාමය මූලස්ථානය කර ගනිමින් විජය රජතුමා ආර්ය ජනපද පාලනය කරන ලදී. (.....) |
| 40. අතීතයේදී ධීවරයින් විසූ ගම්මාන කසීකාරගාම නමින් හඳුන්වා ඇත. | ප්‍රාග් ඓතිහාසික මානවයා විසින් රළු ශිලා මෙවලම් තනාගැනීම සඳහා කහද ගල් භාවිතා කර ඇත. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

25 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**

විභාග අංකය .............................. ලංකා ඉතිහාසය II කාලය පැය දෙකයි

උපදෙස්

♦ පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳව ඓතිහාසික කෙටි සටහන් ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1. ඉරණමඩු වැව | 2. ගම්පොල | 3. මිනිපේ අමුණ | 4. ගෝකණ්ණ |
| 5. රත්නපුරය | 6. යාපහුව | 7. ගල්ඔය | 8. ඌව පළාත |

(නිවැරදි ලකුණු කිරීමකට හා නම් කිරීමකට ලකුණු 1 බැගිනි. කෙටි ඓතිහාසික සටහනට ලකුණු 5 බැගිනි)

02. අභ්‍යන්තර භූගෝලීය පිහිටීමේ ප්‍රධාන ලක්ෂණයක් ලෙස ගංගා හා ගංගා නිම්න ලංකාවේ ඉතිහාසය හැඩගැසීම කෙරෙහි බලපෑ අයුරු විස්තර කරන්න. (ල. 14)

03. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී අභිලේඛන මය මූලාශ්‍රයට හිමිවන්නේ සුවිශේෂී වැදගත්කමකි.
(i) කාසි පිළිබඳව විද්‍යාත්මකව අධ්‍යයනය කරනු ලබන විෂය හඳුන්වන නම කුමක්ද? (ල 1)
(ii) ලංකාවේ භාවිත වූ කාසි වර්ග දෙකක් නම් කරන්න. (ල. 2)
(iii) ශ්‍රී ලංකාවේ කාසි භාවිතයේ ඉතිහාසය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 4)
(iv) සාහිත්‍ය මූලාශ්‍රය මගින් හෙළිවන තොරතුරු අභිලේඛනමය මූලාශ්‍රය මගින් සනාථවන අවස්ථාවන් ගෙනහැර දක්වමින් ඉහත ප්‍රකාශය විමසන්න. (ල. 7)

04. ප්‍රාග් ඓතිහාසික මානවයා එදිනෙදා තම අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම සඳහා තාක්ෂණය උපයෝගී කරගන්නා ලදී. උදාහරණ සපයමින් ප්‍රාග්ඓතිහාසික මානවයාගේ තාක්ෂණික භාවිතය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 14)

05. පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමුකරමින් දේවානම්පියතිස්ස රාජ සමයේ දේශපාලන වැදගත්කම පරීක්ෂා කරන්න.
1. දේවානම්පියතිස්ස රාජ සමයේ ලංකාවේ දේශපාලන පසුබිම
2. ඉන්දියානු ආභාෂය (ල. 14)

06. රජරට ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් ගොඩනැගුණු රජරට ශිෂ්ටාචාරය ලංකාවේ ඉතා දියුණු සභ්‍යත්වයක් වූ බව රජරට ශිෂ්ටාචාරය බිහිවීමට පදනම් වූ කරුණු පිළිබඳ අවධානය යොමුකරමින් විචාරාත්මකව පහදන්න. (ල. 14)

07. ශ්‍රී ලංකාව තුළ කේන්ද්‍රීය දේශපාලන බලයක් ගොඩනැගීමේ පුරෝගාමියා දුටුගැමුණු රජතුමාය.

(i) දුටුගැමුණු රජතුමාගේ දසමහා යෝධයින් පිළිබඳ සඳහන්වන අභිලේඛනයක් නම් කරන්න. (ල. 1)

(ii) රෝහණ රාජ වංශයේ ආරම්භකයා හා එහි මූලස්ථානය නම් කරන්න. (ල. 2)

(iii) කාවන්තිස්ස රජතුමා විසින් රෝහණය තුළ මධ්‍යගත පාලනයක් ගොඩනැගීමට ගත් ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iv) දුටුගැමුණු රජතුමාගේ දේශපාලන හා ආගමික සේවාවන් අගයමින් ඉහත ප්‍රකාශය විචාරාත්මකව පහදන්න. (ල. 7)

08. එක්කෝ (A) කොටසට නැතහොත් (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.


(A) අනුරාධපුර යුගයේ පාලන තන්ත්‍රය ක්‍රියාත්මක වූ අයුරු විස්තර කරන්න.

(B) රජරට ශිෂ්ටාචාරයේ පාලකයින් විසින් අනුගමනය කරන ලද යුද්ධෝපක්‍රම පිළිබඳ විමසන්න.

(ල. 14)

09. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව ඓතිහාසික සටහන් ලියන්න.


1. දීප වංශය
2. පොළොන්නරු යුගයේ විදේශ සබඳතා
3. අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳවැටීම
4. මූල ඓතිහාසික යුගයේ ජනාවාස (7 x 2 = 14)


N

**දෙවන වාර පරීක්ෂණය - 2018**
**ලංකා ඉතිහාසය - 12 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය - 1 කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 1 | 21. | 3 | 31. | 4 |
| 2. | 5 | 12. | 3 | 22. | 4 | 32. | 5 |
| 3. | 1 | 13. | 5 | 23. | 1 | 33. | 2 |
| 4. | 3 | 14. | 1 | 24. | 4 | 34. | 2 |
| 5. | 2 | 15. | 2 | 25. | 3 | 35. | 1 |
| 6. | 1 | 16. | 3 | 26. | 4 | 36. | 2 |
| 7. | 3 | 17. | 5 | 27. | 2 | 37. | 4 |
| 8. | 5 | 18. | 1 | 28. | 5 | 38. | 5 |
| 9. | 5 | 19. | 4 | 29. | 1 | 39. | 1 |
| 10. | 3 | 20. | 1 | 30. | 3 | 40. | 3 |

II කොටස



01. නිවැරදි ලකුණු කිරීමට හා නම් කිරීමකට ලකුණු 1 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 5 බැගිනි. මුළු ලකුණු ප්‍රාණය ලකුණු 18 කි.

02. * අභ්‍යන්තර භූගෝලීය ලක්ෂණ හැඳින්වීම. * ලංකාවේ ගංගාවල පිහිටීම හඳුන්වාදීම. * අරිය ජලවහන රටාව. * ගංගාවල පිහිටීම හා ගංගා හා ගංගානිම්න ලංකාවේ ඉතිහාසය හැඩගැසීමට බලපෑ අයුරු විස්තර කරතිබීම.
1. ජනාවාස බිහිවීම හා ව්‍යාප්තියට බලපෑ අයුරු. 2. දේශසීමා ලෙස ගංගා භාවිතා කිරීම (රජරට, රුහුණු, අටදහස්රට, දොළොස්දහස් රට) 3. පැරණි මාර්ග ගංගා නිම්න ඔස්සේ වැටී තිබීම. උදා ඃ දුටුගැමුණු රජු රජරට ජයගත් සටනට භාවිත කළ මාර්ගය මහවැලි ගඟ ඔස්සේ වැටී තිබීම. 4. වැව් නිර්මාණය. 5. ආර්ථික වැදගත්කම 6. රාජධානි ගංගා ඇසුරුකරගෙන බිහිවීම. උදා ඃ අනුරාධපුරය - මල්වතු ඔය, පොළොන්නරුව - මහවැලි ගඟ, දඹදෙණිය - දැදුරුඔය. 7. ගංගා මුවදොර වරායවල් හා වෙළඳ මධ්‍යස්ථාන පිහිටා තිබීම. මහවැලි - ත්‍රිකුණාමල වරාය, කැළණි ගඟ - කොළොම්තොට, කළුගඟ - කළුතර. (ල. 14)

03. (i) නානක විද්‍යාව. (ල. 1)
(ii) කහවනු, මසු, අඩමසු, හස් එබූ කාසි, ස්වස්තික, ගජලක්ෂ්මි, ගජ ලක්ෂ්මි ඇතා හා ස්වස්තිකය, ලැරීනය, තඹ මසු, රෝම කාසි, සිංහ කාසි. (ල. 2)
(iii) * මුලින්ම ලංකාවේ නිෂ්පාදනය නොකළ බව. * ඉන්දියානු කාසි (කහවනු) ලංකාවේ මුලින්ම භාවිත කළ බව. * ක්‍රි.පූ. පළමු සියවසේ අග භාගයේදී හෝ ක්‍රි.ව. පළමු සියවසේ මුල්භාගයේදී ලංකාවේ කාසි නිපදවූ බව. * කැනීම් මඟින් කාසි නිපදවීමට යොදාගත් අච්චු හමුවීම. * රන්, රිදී, තඹ වැනි ලෝහවලින් කාසි නිපදවා ඇතිබව. ආදී තොරතුරු අන්තර්ගතවීම වැදගත්. (ල. 4)
(iv) උදාහරණ ගෙන දෙමින් විස්තර කිරීම වැදගත්.
* අර්ය ජනාවාස පිහිටුවීම පිළිබඳ තොරතුරු - බ්‍රාහ්මීය ලෙන් ලිපිවල පිහිටීම අනුව තහවුරු වේ. ( දේශපාලන තොරතුරු) * මහින්දාගමනය පිළිබඳ තොරතුරු - සාංචි දා කරඬුවෙන්, මිහින්තලේ රජගල සෙල්ලිපිවලින් සනාථ වේ. (ආගමික තොරතුරු)
* රජවරුන්, උපරජවරුන්, ප්‍රාදේශීය රජවරුන් පිළිබඳ තොරතුරු සනාථවන අවස්ථා (දේශපාලන) උත්තිය රජු - මිහින්තලේ ලෙන් ලිපි, සද්ධාතිස්ස රජු - රජගල ලිපි, විජයබාහු රජු - පණාකඩුව තඹ සන්නස, වසභ රජු - වල්ලිපුරම් සන්නස.
* ඇමතිවරුන් හා රාජ්‍ය නිලධාරීන් පිළිබඳ තොරතුරු (දේශපාලන) ඇමතිවරුන් - පරමාකන්ද ලිපිය, භාණ්ඩාගාරික - මිහින්තලේ ලිපි, ගණකවරු - මහඇලගමුව ලිපිය, දසමහායෝධයින් - වැල්ලේලුගොඩ කන්ද, සිතුල්පහුව, සංඛපාල විහාර ලිපිය.
* ආර්ථික තොරතුරු - වෙළඳ ශ්‍රේණි පිළිබඳ තොරතුරු - සැස්සේරුව ලිපිය, බදුවර්ග - ගොඩවාය ලිපිය, වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු - බදුළු හෝ පිටිගම/හැබැස්ස, තිඹිරිවැව. (ල. 7)

04. ප්‍රාග් ඓතිහාසික මානවයා තම අවශ්‍යතා ඉටුකර ගැනීමට තාක්ෂණික ක්‍රම ප්‍රයෝජනයට ගත් අයුරු උදාහරණ සපයමින් විස්තර කිරීම වැදගත් වේ.
* ශිලා මෙවලම් තනා ගැනීම සඳහා වෙර පහර නොහොත් පීඩන ශල්කනය යොදාගත් බව. (රළු ශිලා මෙවලම් / ජ්‍යාමිතික ක්ෂුද්‍ර මෙවලම්) * ඇටසැකිළිවල ගුරුගල් ආලේප කිරීම නිසා වර්ණ සකස්කරගැනීමේ තාක්ෂණය පිළිබඳ දැනුම තිබූ බව. * ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් පූර්ව ඓතිහාසික යුගයේදී විවිධ කාර්යයන් සඳහා තාක්ෂණය භාවිතා කළ බව. - ගිලා නොබසින ලෙස ගෙබිම සකස් කිරීම (උඩරංචාමඩම), පොළවට ලම්භකවන පරිදි බිත්ති බැඳීමේ තාක්ෂණය (උඩරංචාමඩම), සකපෝරුව භාවිතයෙන් මැටි බඳුන් සකස් කිරීමේ තාක්ෂණය, මැටිබඳුන් පිළිස්සීම පිළිබඳ (උඩරංචාමඩම), සුදුසු මැටි වර්ගය තෝරාගැනීම, අවශ්‍ය තරමට පදම් කිරීම, යකඩ නිෂ්පාදනය හා යකඩ මෙවලම් තනාගැනීම, මැටි බඳුන් නිෂ්පාදනය, රූප අලංකරණ උපකරණ සකස්කරගැනීම, සුසාන ඉදිකිරීම් තාක්ෂණය (මැටි ඔරු, ශිලා මංජුසා සොහොන්, බරණි) (ල. 14)

05. දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ වැදගත්කම

සමකාලීන පසුබිම :

බලය විකේන්ද්‍රගතය පැවතීම, මුටසිව රජුගේ වැඩිමහල් පුතා නොවීම හේතුවෙන් රාජ්‍යත්වය සඳහා සහෝදරයන්ගේ බලපෑම., මලය, රුහුණු ආදී ප්‍රදේශවල පැවති ස්වාධීන පාලන මධ්‍යස්ථාන වලින් එල්ල වූ අභියෝග - (චංදනගාම, සඳුන්ගාම, කාචරගාම, දීඝගාම), දකුණු ඉන්දියාවේ බලවත් වූ චෝළ, චේර, පාණ්ඩ්‍ය ආදී රාජ්‍යයන්ගෙන් ඇතිවූ බලපෑම, එම අභියෝග වලට මුහුණ දීම සඳහා ඒ වන විට උතුරු ඉන්දියාවේ බලවත්ව සිටි අශෝක අධිරාජයා සමඟ මිත්‍ර සබඳතා ඇතිකරගැනීම.

ඉන්දීය ආභාෂය :

අශෝක අධිරාජ්‍ය හා දේවානම්පියතිස්ස රජු සමඟ මිත්‍ර සබඳතා ඇතිකරගැනීම, දෙරට අතර ඇතිවූ දූත ගමන්, මෞර්ය පාලන ක්‍රමය, අභිෂේක ක්‍රමය දායාදවීම, මහින්දාගමනය නිසා බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ පාලන සංකල්ප දේශපාලනයට එක්වීම, බෞද්ධ භික්ෂූන් වහන්සේලා රජවරුන්ගේ උපදේශකයන් බවට පත්වීම, බුදුදහම ලංකාව පුරා පැතිරීම නිසා ඒ හරහා දේවානම්පියතිස්ස රජුට ප්‍රාදේශීය පාලකයින්ගේ සහය ලබාගැනීමට හැකිවීම. උදා : ශ්‍රී මහා බෝධි රෝපණ උත්සවය, වෙහෙර විහාර ඉදිකිරීම, භික්ෂු ශාසනය හා භික්ෂුණී ශාසනය ලංකාව පුරා පැතිරයාම., දේශපාලන වශයෙන් හික්මීමක් ඇති පාලිතයන් හා පාලකයන් පිරිසක් බිහිවීම. (ල. 14)

06. * කෘෂිකර්මාන්තය හා වෙළඳාම පදනම් කරගනිමින් රජරට ශිෂ්ටාචාරය හෙවත් ජලාශ්‍රිත ශිෂ්ටාචාරය බිහිවූ බව හඳුන්වා තිබීම. * ලංකාවේ වියළි කලාපයේ ගංගා නිම්නවල කෘෂිකාර්මික කටයුතුවල නිරතවිය. * වැව් ඉදිකිරීම, ඇලමාර්ග ඉදිකිරීම හා ඒවාට රාජ්‍ය අනුග්‍රහය ලබාදීම. * මුලින්ම හේන් වගා කටයුතු වල නිරත වූ අතර පසුව වැසි ජලයේ හා ජලසම්පාදන ක්‍රම යටතේ වී වගාව සිදුවූ බව. * රජරට ප්‍රදේශයේ පැවති තැනිතලා බිම සරුපස ආදී සාධක කෘෂිකර්මයට වඩා යෝග්‍ය වීම. * ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පෙර අපරදිග මුහුදු ගමන් මාර්ග මධ්‍යස්ථානයක පිහිටා ඇති බැවින් අතීතයේ සිටම විදේශ වෙළඳාම් කටයුතු සිදුවීම. * රට අභ්‍යන්තරයේ අභ්‍යන්තර වෙළඳාම පැවතීම, පැරණි වෙළෙඳ රඨසක් ලංකාව පුරා පිහිටා තිබීම. * ලංකාව වටා පිහිටි වරායවල් විදේශ වෙළඳාම් කටයුතු වලට උපකාරී වීම.

07. (i) සිතුල්පව්ව, සංඛපාල විහාර ලිපිය, වැල්ලේලුගොඩ කන්ද ලිපිය.

(ii) මහානාම යුව රජ, මාගම, (මහාගාම / තිසමහාරාමය)

(iii) කාවන්තිස්ස රජු මාගම රාජ්‍යත්වයට පත්වන විට රෝහණය තුළ ප්‍රාදේශීය රාජ්‍යයන් කිහිපයක් පැවති බව. ( කැළණිය, මලය, සේරු, සෝම, ලෝණ)

කාවන්තිස්ස රජුගේ පියා වූ ගෝඨාභය රජු ආක්‍රමණ මගින් කතරගම ප්‍රදේශයේ පැවති ප්‍රාදේශීය රාජ්‍ය දිනාගන්නා ලදී. කැළණිය හා මලය ප්‍රදේශ විවාහ සබඳතා මගින් ජයගත් බව ආගමික ක්‍රියාකාරකම් ඇසුරෙන් සේරු, සෝම, ලෝණ රාජ්‍යන්හි බලය දිනාගත් බව.

(iv) **<u>දේශපාලන :</u>**

* මෙම අවධියේදී ලංකාවේ දේශපාලන බලය විකේන්ද්‍රගතව පැවතීම (ප්‍රාදේශීය රාජ්‍යයන් ගණනාවක් යටතේ පාලනය වීම.) * කාවන්තිස්ස රජතුමා රෝහණය එක්සේසත් කළ බව. * රජරට ප්‍රදේශ එළාර නම් සොළී රජතුමා වසර 44 ක කාලයක් ධාර්මිකව පාලනය කළ බව. * රෝහණය හා රජරට ආසන්න ප්‍රදේශවල ස්වාධීනව පාලනය මෙහෙයවූ පරුමකවරුන්ගේ (දසමහා යෝධයන්) සහය ලබාගනිමින් සේනා සංවිධානය කර එළාර පරදවා රජරට ජය ගැනීම. * ලංකාව පළමුවරට එක්සේසත් කිරීම. * භල්ලූකගේ ආක්‍රමණය මැඩ පැවැත්වීම. * රජරට ජයගැනීම සඳහා සහය ව පරුමකවරුන්ට තනතුරු නිල නාම ලබාදී පාලනය විධිමත් කිරීම.

**<u>ආගමික :</u>**

* කළුගල් යොදා මුලින්ම ආගමික ගොඩනැගිලි ඉදිකිරීම. * ආගමට රාජ්‍ය අනුග්‍රහය ලබාදීම. * මිරිසවැටිය, රුවන්වැලිසෑය, ලෝවාමහාපාය වැනි වෙහෙර විහාර ඉදිකිරීම. * මහා විහාරයේ අග්‍රගන්‍ය දායකයා වීම.

08. (A) අනුරාධපුර යුගයේ පාලන තන්ත්‍රය

* රාජාණ්ඩු පාලනයක් පැවතීම. * බෙහෙවින් ජන සම්මත වීම. * පණ්ඩුකාභය රජතුමා පාලනය කරමින් සංවිධානාත්මක පාලනයක් ගොඩනැගීම, අනුරාධපුර නගර අගනුවරක් ලෙස සංවර්ධනය කිරීම. * දේවානම්පියතිස්ස රාජ සමයේදී පාලනය සඳහා උතුරු ඉන්දීය (මෞර්ය) ආභාෂය ලැබීම. * පාලනය සම්බන්ධ බොහෝ නිලධාරීන්ගේ තනතුරු නාම අභිලේඛන වල සඳහන් වීම (සේනාපති, පුරෝහිත, බඩගණික, ඇමති, දෝවාරික, අතුක, දණ්ඩාංක, මහලේ) * මධ්‍ය පාලනයේ පසුව තකා ප්‍රාදේශීය පාලන ඒකක වලට බෙදා පැවතීම. (රජරට, රෝහණය, මලය රට, දක්ෂිණ දේශය, අටදහස් රට, දොළොස්දහස් රට) * රජරට අගරජු (මායා රට දක්ෂිණ දේශය - යුවරජු(මාපා), රෝහණය - ඈපා පාලන කටයුතු මෙහෙයවීම. * පූර්ව රාජසමයේදී ගෘහපති, ගමික, පරුමක, දසගම් ඇත්තන් පරුමක, මපුරුමුක වැනි නිලධාරීන් පාලන කටයුතුවලට දායක වීම.

(B) යුද්ධෝපක්‍රම :

* පූර්ව ආරක්ෂක ක්‍රම භාවිතය - අගනගර ඉදිකිරීම, බලකොටු ඉදිකිරීම (විජිතපුර , සීගිරිය, යාපහුව) පවුරු, ප්‍රාකාර, දියඅගල් ආදිය ඉදිකිරීම. * චතුරංගනී සේනා සංවිධානය (ඇත්, අස්, රිය, පාබල) * සතුරා මුලාකිරීම සඳහා උපක්‍රම භාවිතය. උදා : දුටුගැමුණු රජුට සමාන පිළිරූ කරවීම. * අල්ලස් දී නම්මාගැනීම (පැරකුම් රජු ගජබාහුගේ සෙනෙවිවරුන්හට) * උපක්‍රමශීලීව සතුරු හමුදාවට එක්වීම (විජයබාහු රජුගේ රවිදේව හා චල යන සෙනෙවිවරුන් චෝල හමුදාවට එක්ව පසුව විජයබාහු රජු සහය ලබාදීම) * පෙරදිග යුද්ධ ආචාර ධර්ම භාවිතය ( ද්වන්ධව සටන්) * පරාජිත සතුරට ගරු කිරීම (දුටුගැමුණු රජු එළාර රජුට, පැරකුම් රජු II ගජබාහු රජුට)

09. **<u>දීපවංශය :</u>** * දැනට ශ්‍රී ලංකාවේ ඇති පැරණිතම වංස කතාවයි. * පරිච්ඡේද 22ක් ගාථා 1350 ක් යුක්තය. * ක්‍රි.ව. 4/5 සියවස්වලදී රචනාකර ඇත. * භික්ෂුණී ශාසනය පිහිටුවීම පිළිබඳ තොරතුරු බහුල ලෙස සඳහන් වේ. * බුද්ධකාලයේ පටන් මහසෙන් රජුගේ රාජ්‍ය කාලය අවසානය දක්වා තොරතුරු ඇතුළත් වේ. * මහාවංශයේ දක්නට නැති තොරතුරු අඩංගුව ඇති බව. * මහා සම්මත රජ පරපුර, බුද්ධ චරිතය, බුදුන් වහන්සේගේ ලංකා ගමන් මුල් ආර්ය ජනාවාස, පණ්ඩුකාභය කතා පුවත/බුදු සසුන හඳුන්වාදීම ආදී තොරතුරු අඩංගුය.

**<u>පොලොන්නරු යුගයේ විදේශ සබඳතා :</u>**

* මෙම යුගයේ විදේශ සබඳතා පිළිබඳ විමසීමේදී මහ පැරකුම්, විජයබාහු හා නිශ්ශංකමල්ල වැනි රජවරුන්ගේ ක්‍රියාකලාපයන් ඉතා වැදගත් වේ. * ආර්ථික, දේශපාලන හා සංස්කෘතික සබඳතා පවත්වා ඇත. පළමු **විජයබාහු** - බුරුමය සමඟ වෙළඳ සබඳතා, බුරුම දේශයෙන් උපසම්පදාව රැගෙනඒම, ජගතිපාලගේ දියණිය ලීලාවතී විවාහ කරගැනීම, කාලිංගයේ ත්‍රිලෝකසුන්දරී විවාහකරගැනීම. * සොයුරිය වූ මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමාරයෙකුට විවාහ කරදීම, තම පුත්‍රයා වූ වික්‍රමබාහු කුමරුට කාලිංග දේශයෙන් සුන්දර මහාදේවී නම් කුමරිය විවාහකරදීම, චාලුක්‍ය රාජ්‍යයට තුඩු පඬුර යැවීම.

**පළමු පැරකුම් රජු :** * බුරුමය ආක්‍රමණය, පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කිරීම, කාම්භෝජය සමඟ මිත්‍ර සබඳතා පැවැත්වීම.

**නිශ්ශංකමල්ල රජතුමා :** * චාලුක්‍ය, කාලිංග, ගුජරාට, අනු, බුරුම වැනි රටවල් සමඟ මිත්‍ර සබඳතා පැවැත්වීම. * දකුණු ඉන්දියාව ආක්‍රමණය කිරීම. (රාමේෂ්වරම)

අනුරාධපුර යුගයේ පරිහාණිය හා බිඳවැටීම : * දුර්වල පාලකයින් බලයට පත්වීම (V සේන/V මිහිඳු) * ලම්භකරණ හා මෞර්ය රාජවංශ අතර ඇතිවූ බල අරගලය. * විදේශ ආක්‍රමණ * ආක්‍රමණ නිසා සම්පත් විනාශවීම, වාරිපද්ධතිය බිඳ වැටීම. * කුලී හමුදාවල ක්‍රියාකලාපය. * චෝළ ආක්‍රමණ.

මූල ඓතිහාසික යුගයේ ජනාවාස :

* ගම් වැව් මූලික කරගනිමින් ගම් බිහිවීම. * එම ගම්මාන වාපී ගම්මාන ලෙස හැඳින්වේ. (සුන්දරීවාපී ගාම/ කඩහවාපී ගාම/සුමන වාපී ගාම) * වැව, ගම, කුඹුර, හේන, කැලෑව, නිවාස ජනාවාසවල මූලික අංග බවට පත්වීම. * ගමක පවුල් 5 - 25 අතර ප්‍රමාණයක් ජීවත්වීම. * ගමේ ප්‍රධානියා ගමික නමින් හැඳින්වේ. * නගර බිහිවීම. * පළමු සියවසේ සිට විශාල වැව් ඉදිකිරීම. * ක්‍රි.ව. තුන්වන ලියවස වන විට අනුරාධපුර නගරය දියුණුවට පත්වීම.